# අ.පො.ස. (සා.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2014

**සිංහල භාෂාව හා සාහිත්‍යය I, II** | **පැය තුනයි**

සැලකිය යුතුයි :

(i) **සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.** මෙම පත්‍රය සඳහා **ලකුණු 40ක්** හිමි වේ.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.

---

- අංක **01** සිට **03** තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වචනය තෝරන්න.

1. අනගාරික ධර්මපාලතුමා **කළු සුද්දන්ගේ** පරගැති අදහස් වෙනස් කොට ඔවුන් තුළ ජාත්‍යාලය දැනවීමට කටයුතු කළේය.
   (1) වර්ණ භේදවාදීන්ගේ
   (2) අන්ධානුකරණයේ යෙදෙන්නන්ගේ
   (3) මෝස්තර නිර්මාපකයන්ගේ
   (4) අපරදිග අනුකාරකයන්ගේ

2. පැරණි සිංහල සන්දේශ කාව්‍යවලට **අලගු තියන්නත් බැරි** කාව්‍ය නිර්මාණ එදා මෙන් අදත් බිහි වේ.
   (1) අභියෝග නොකළ හැකි
   (2) සංසන්දනය නොකළ හැකි
   (3) සුළුවෙන් හෝ සමාන නොකළ හැකි
   (4) ඉහළින් නොසැලකිය හැකි

3. අයියාගේ නොමනා ක්‍රියා නිසා තමන්ගේ **මූණේ දැලි ගෑවෙන බව** තාත්තා නිතර කී වදනකි.
   (1) අපකීර්තියට පත්වීම
   (2) අපහසුතාවට පත්වීම
   (3) කෝපයට පත්වීම
   (4) අවලස්සන වීම

- අංක **04** සිට **06** තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

4. රජයේ එකම ...................................... වනුයේ රටෙහි යටිතල පහසුකම් දියුණු කර ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීමයි.
   (1) කාර්යය (2) ප්‍රතිපත්තිය (3) ප්‍රකාශනය (4) සටන් පාඨය

5. අපේ රටට පමණක් ...................... වී වර්ග වගා කර පරිභෝජනයට යොදා ගැනීම මගින් නීරෝගී දිවියකට මග සැලසේ.
   (1) අන්වර්ථ (2) අනුබද්ධිත (3) ආනුෂංගික (4) ආවේණික

6. පොදු ජනතාවගේ ........................ සඳහා ඇති ස්ථාන ආරක්ෂා කිරීම අප කාගේත් වගකීමකි.
   (1) පරිභෝජනය (2) සංසරණය (3) පරිහරණය (4) පරිශීලනය

7. **අකාරාදි පිළිවෙළ** නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.
   (1) තෝලංගමුව, දුනුගමුව, වස්ගොමුව, විල්ගමුව
   (2) කැගල්ල, අඹේපුස්ස, මාතලේ, පැල්පොල
   (3) තම්පලා, ගෝවා, කැකිරි, දඹල
   (4) මාලන්, සරත්, අනුර, විජය

2 වන පිටුව බලන්න

8. **විරුද්ධාර්ථවත් යුගල පදයක්** යෙදී ඇති වාක්‍යය තෝරන්න.
   (1) මහජනයාගේ ගමන් බිමන් පහසුව උදෙසා අධිවේගී මාර්ග යොදා ගැනේ.
   (2) බොහෝ වැඩිහිටි ඉඩම් හිමියෝ තම ඔප්පු තිරප්පු නිරවුල් කර ගැනීමට කටයුතු කරති.
   (3) අනුන්ගේ ඇද කුද සෙවීම අප විසින් නොකළ යුත්තකි.
   (4) බාල මහලු සියල්ලෝම සිංහල හින්දු අලුත් අවුරුදු චාරිත්‍ර පිළිපදිති.

9. ඉස්පිල්ල, රකාරාංශය, පාපිල්ල, ගයනුකිත්ත යන **පිල්ලම් අනුපිළිවෙළින්** යෙදී ඇති වචන පේළිය තෝරන්න.
   (1) සිහින, ප්‍රජාව, ඖරස, භ්‍රාන්තිය
   (2) කිරණ, ප්‍රබල, රුහුණු, ගෞතම
   (3) නිකිණි, ලේකම්, ග්‍රහණය, ගෞරව
   (4) කියඹු, ශ්‍රමය, රුහැන, කෘමියා

10. අංක **10** සහ **11** ප්‍රශ්නවල සෑම පදයක ම **අක්ෂර වින්‍යාසය නිවැරදිව** යෙදී ඇති වරණය තෝරන්න.
   (1) ධනේශ්වර, සාම්ප්‍රදායික, හෙණ්ඩුව, ශීඝ්‍රගාමී
   (2) පරමාර්ථ, පරිගණක, ප්‍රජාව, ශිෂ්‍යාචාරය
   (3) නිෂ්ඵල, චිත්තාකර්ශනීය, දුරවබෝධ, සමස්ථ
   (4) ජ්‍යාමිතිය, දෘෂ්‍ය කාව්‍ය, මර්ධනය, දූර්දර්ශී

11. (1) වීරෝධාර, කුටුම්භය, මණ්ඩලය, ලේඛණය
   (2) මජ්ඣිම, කතෘ, මෛත්‍රිය, නිර්නායක
   (3) උෂ්ණ, විශේෂණ, ප්‍රත්‍යක්ෂ, භූෂණ
   (4) අභියෝග, කර්කෂ, ශ්වේත, ශ්‍රේනිය

12. **විරාම ලකුණු වැරදි ලෙස යෙදුණු** වාක්‍යය තෝරන්න.
   (1) “මහත්තයා, මෙන්න මගේ මොකුත් නොදන්නා පුත්තු දෙන්නා”
   (2) තාත්තේ, පසුගිය අවුරුදු දෙකේම මගේ හිතෙත් ඒක තිබුණා?
   (3) “මහත්තයා ! කරුණාකරල මේක කියවන්න ! මම හරිම මෝඩයෙක් !
   (4) “මම එන්නේ මගේ දරුවන් ඉගෙන ගන්න ඉස්කෝලෙ ඉඳල”, වාං ලුං කීවේය.

13. මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් පමණක් දෙන** පද පේළිය තෝරන්න.
   (1) අනංගයා - මදරද, මල්සර, වියොවග, පන්සිළු
   (2) ලිය - ස්ත්‍රිය, විලාසිනි, මාගම, මනබඳ
   (3) නෙළුම - අරවින්ද, සහස්පත, පංකජ, පඬෙර
   (4) පොළව - වසුන්ධරා, ධරණි, සියොත්, පඨවි

14. මුලින් දී ඇති පදයට **විරුද්ධාර්ථවත් පදයක් සහිත** පද පේළිය තෝරන්න.
   (1) උත්සාහය - ධෛර්යය, ශක්තිය, උනන්දුව, ප්‍රයත්නය
   (2) උත්කෘෂ්ට - උසස්, අධම, උතුම්, ශ්‍රේෂ්ඨ
   (3) ආධුනික - නුපුහුණු, නුගත්, නවක, අප්‍රවීණ
   (4) හස්තය - කර, බාහු, බුජ, අත

- අංක **15** සිට **18** තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.

15. ඉකුත් දශක දෙක තුළ අපගේ සිංහල ගීතය භාවපූර්ණ **සුනිශිත** කලා නිර්මාණයක් බවට පත් විය.
   (1) යථාර්ථවත්
   (2) ආහ්ලාද ජනක
   (3) මනාසේ තියුණු වූ
   (4) ධ්වනි පූර්ණ

16. රජරට පැරණි වාරිකර්මාන්තයේ **ජලහරණය** සඳහා ඇළ මාර්ග ජාලයක් සකස් කර තිබූ බවට සාධක ඇත.
   (1) ජලය පිට කිරීම
   (2) ජලය පිටාර ගැලීම
   (3) ජලය ගලා යාම
   (4) ජලය කාන්දුවීම

3 වන පිටුව බලන්න

17. "වෙල් **දෙණිවල** ඇවිදින දෙපා රිදෙන විට විහඟ ගීත බණ පද වේවා"
    (1) නියරවල් උඩ
    (2) වගුරු බිම්වල
    (3) වැලිතලා අතර
    (4) මිටියාවත්වල

18. අප කවීන්ගේ කාව්‍යමය භාෂාව රසඥතාවෙන් පරිපූර්ණව **පරිපාකයට** පත් වූයේ කෝට්ටේ සාහිත්‍ය යුගයේය.
    (1) කෙළවරට
    (2) මුහුකුරායාමට
    (3) භාව පූර්ණත්වයට
    (4) මාධුර්යයට

19. පහත දැක්වෙන වාක්‍යයේ තද කළු අකුරෙන් මුද්‍රිත කොටස වෙනුවට යෙදිය හැකි **වඩාත් ගැළපෙන තනි පදය** තෝරන්න.
    **නොයෙක් දේශයන්හි සංචාරයෙහි යෙදුණු** පැරැන්නෝ ඒ ඒ දේශවල ජනතාව සමග සබඳතා ගොඩනගා ගත්හ.
    (1) දේශාක්‍රමණයෙහි
    (2) දේශ ගවේෂණයෙහි
    (3) දිග් විජයෙහි
    (4) දේශාටනයෙහි

20. **තද්ධිත නාමයක් යෙදී නැති** වරණය තෝරන්න.
    (1) වර්ෂාව පිළිබඳ ව කාලගුණ දෙපාර්තමේන්තුව පළ කරන පුවත් විශ්වසනීය වේ.
    (2) එය සෞභාග්‍යවත් කාල පරිච්ඡේදයක් විය.
    (3) පැරකුම්බා කුමරු දක්ෂිණ දේශයේ සීමාව වටා සවිමත් බලකොටු තැනවීය.
    (4) දැඩි ග්‍රීෂ්මය නිසා ඇගේ දිගටි මුහුණ දහඩියෙන් තෙත් වී තිබිණි.

21. **වැරදි** අදහස දෙන වරණය තෝරන්න.
    (1) "සුසිල්" යන්නෙහි "සු" යන්න උපසර්ගයකි.
    (2) "අනතුරුව" යන්න නිපාත පදයකි.
    (3) "සොබමන්" යන්න කෘදන්ත පදයකි.
    (4) "තරුණ යුවළ" යන්නෙහි "තරුණ" යන්න විශේෂණ පදයකි.

22. "කීවෙහු" යන්න
    (1) මධ්‍යම පුරුෂ කර්තෘ කාරක අතීත කාල බහුවචන ක්‍රියාපදයකි.
    (2) මධ්‍යම පුරුෂ කර්තෘ කාරක අතීත කාල, ඒකවචන ක්‍රියාපදයකි.
    (3) මධ්‍යම පුරුෂ කර්ම කාරක අතීත කාල බහුවචන ක්‍රියාපදයකි.
    (4) මධ්‍යම පුරුෂ කර්ම කාරක අතීත කාල ඒකවචන ක්‍රියාපදයකි.

23. "දරුවන් කෙරෙහි උපන් ආලෙයෙනැයි
    හදාවඩා ගනු වස් උන් ඉල්ලුවේ"
    මෙම ගීත ඛණ්ඩයේ "**වස්**" යනු
    (1) සීමාව ඇඟවීමේ නිපාතයකි.
    (2) වාක්‍යය අලංකාර කිරීමේ නිපාතයකි.
    (3) පද සම්බන්ධ කිරීමේ නිපාතයකි.
    (4) ක්‍රියා විශේෂණ අර්ථයේ නිපාතයකි.

24. "නිකෙලෙස්" යන පදයේ **"නි"** යන උපසර්ගය නිසා
    (1) පදයේ අර්ථය වැඩි වේ.
    (2) පදයේ අර්ථයට බාධා ඇති වේ.
    (3) පද අර්ථයේ සුළු වෙනසක් ඇති වේ.
    (4) පදයට විරුද්ධ අර්ථයක් ලැබේ.

4 වන පිටුව බලන්න

25. මුලින් දැක්වෙන පදය **නිවැරදි ලෙස විසන්ධි කර ඇති** වරණය තෝරන්න.
    (1) අත්‍යුදර = අත්‍යු + දර
    (2) අන්වර්ථ = අනු + අර්ථ
    (3) අශ්වාරෝහක = අශ්ව + රෝහක
    (4) නෙළුම් අල = නෙළුන් + අල

- අංක **26** සිට **28** තෙක් දී ඇති එක් එක් ප්‍රකාශනයෙහි අදහසට **වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ** තෝරන්න.

26. තමන් සතු දේ අනුන්ට දී වෙන කෙනෙකුගෙන් එය ලැබීමට තැත් කිරීම
    (1) අත දීලා දත නියවීම
    (2) අඬුව තිබෙද්දී අත පුලුස්සා ගැනීම
    (3) අත්තටු කපා පියාඹන්ට කීම
    (4) ඇමක් දී මාළුවකු අල්ලා ගැනීම

27. විපතෙන් වඩාත් විපතට වැටීම
    (1) අටුව කඩා පුටුව සෑදීම
    (2) අනේ කාලේ වනේ වාසේ
    (3) අටුවෙන් දුමට පැනීම
    (4) අතිරසත් තිත්ත වීම

28. මෝඩ වැඩක් කිරීම
    (1) අඟින් කිරි දෙවීම
    (2) අළුගොඩට පිඹීම
    (3) ආඩි හත් දෙනාගේ කැඳ ඉවීම
    (4) අං මතුවීම

- අංක **29** සිට **31** තෙක් ප්‍රශ්නවල **ව්‍යාකරණානුකූලව නිවැරදි** වාක්‍යය තෝරන්න.

29. (1) විශ්ව විද්‍යාල කථිකාචාර්යවරයකු වූ බණ්ඩාර මහතාට මගේ දෙමව්පියෝ ගරු කරති.
    (2) විශ්ව විද්‍යාල කථිකාචාර්යවරයෙක් වූ බණ්ඩාර මහතාට මගේ දෙමව්පියෝ ගරු කරති.
    (3) විශ්ව විද්‍යාල කථිකාචාර්යවරයෙක් වූ බණ්ඩාර මහතාට මගේ දෙමව්පියන් ගරු කරති.
    (4) විශ්ව විද්‍යාල කථිකාචාර්යවරයෙකු වූ බණ්ඩාර මහතාට මගේ දෙමව්පියෝ ගරු කෙරෙති.

30. (1) රියදුරන් රථ පණ ගන්වාගෙන බලා සිටියහ.
    (2) මිතුරු කැල සොහොයුරාට උදව් කළේය.
    (3) තාත්තා වේලාසන ගෙදර එති'යි දියණියෝ බලා සිටියාහ.
    (4) දරුවන් ඉගෙන ගනිද්දී දෙමව්පියන් සතුටු විය.

31. (1) පාසලේ මුල් ගුරුතුමා ශිෂ්‍යයන්ට තෑගි බෙදා දුන්හ.
    (2) දරුවන් අද සවසට ගෙදර යන්නේ නැත.
    (3) මම රූපවාහිනිය නරඹද්දී දෙමව්පියෝ පැමිණියහ.
    (4) ශිෂ්‍යයෝ කැටුව ගුරුවරු පන්ති කාමරවලට ගියහ.

32. බොහෝ කාන්තාවෝ **රන්බඩු** පැලඳීමට කැමැත්තක් දක්වති. මෙහි "රන්බඩු" යන්න.
    (1) විශේෂණ සමාස පදයකි.
    (2) අන්‍යාර්ථ සමාස පදයකි.
    (3) විභක්ති සමාස පදයකි.
    (4) ද්වන්ද්ව සමාස පදයකි.

33. **රූපක දෙකක්** යෙදී ඇති වරණය තෝරන්න.
    (1) තඹ වතුරෙව් තුරු බිජු රැඳි නුබ කෙතට
    (2) දිනපති දෙව්රද එන මග නියම කොට
    (3) තිසර දිමුතු මුතුහර පැලඳ මනරමා
    (4) දිසි රන ලියෙව් රූ සිරි යුත් මෙපුරඟන

5 වන පිටුව බලන්න

- අංක **34** සිට **36** තෙක් ඇති ප්‍රශ්නවල මුලින් ඉදිරිපත් කර ඇති පාඨ සඳහා වඩාත් සමීප අර්ථය දෙන වරණය සොයන්න.

34. ජාතියක ආගම, ජීවන ක්‍රම, ගති පැවතුම්, චාරිත්‍ර වාරිත්‍ර ආදිය හැරුණු විට සංස්කෘතික වශයෙන් උසස් තැනක් හිමි වන්නේ කලා ශිල්පවලටය.
   (1) ජාතියක කලා ශිල්පවලට පමණක් නොව එම ජාතියේ ආගම, ජීවන ක්‍රම හා චාරිත්‍ර වාරිත්‍ර ආදියට ද උසස් තැනක් ලබාදීම අවශ්‍ය වේ.
   (2) ජාතියක ආගම, ජීවන ක්‍රමය, ගති පැවතුම්, චාරිත්‍ර වාරිත්‍ර ආදිය මෙන්ම කලා ශිල්පවලට ද සංස්කෘතික වටිනාකමක් හිමිවේ.
   (3) සංස්කෘතික වශයෙන් ගත්කල ආගම, ජීවන ක්‍රමය, ගති පැවතුම්, චාරිත්‍ර වාරිත්‍ර ආදියට වඩා කලා ශිල්පවලට උසස් තැනක් හිමිවේ.
   (4) කලා ශිල්පවලට මෙන්ම ජාතියක ආගම, ජීවන ක්‍රම හා චාරිත්‍ර වාරිත්‍ර ආදිය ද උසස් තැනක වැජඹේ.

35. රුචිකත්වය හා රසඥතාව වර්ධනය කරමින් දරුවන් සංවේදී බවට පත් කිරීමටත් විචාර බුද්ධිය දියුණු කිරීමටත් සාහිත්‍ය විෂයය ප්‍රබල සාධකයක් වේ.
   (1) සාහිත්‍යය මගින් දරුවන්ගේ සංවේදී බව, රුචිකත්වය, රසඥතාව හා විචාර බුද්ධිය දියුණු වේ.
   (2) රුචිකත්වයේ හා රසඥතාවයේ වර්ධනය සාහිත්‍යයේ දියුණුවට හේතුවේ.
   (3) විචාර බුද්ධියේ දියුණුව, සංවේදිතාව හා රුචිකත්වය දියුණුවීමට ඉවහල් වේ.
   (4) සාහිත්‍යය ප්‍රබල විෂයයක් වී ඇත්තේ රුචිකත්වයට අදාළ රසඥතාව දියුණු කරන නිසාය.

36. සිංහල ගීතයේ යථාර්ථවාදී ප්‍රවණතාවෙහි දක්නට ලැබෙන විශේෂත්වය නම් ගීතය මගින් මිනිසුන් අතර ඇති වන සබඳතා සියුම් ලෙස නිර්මාණය කර දැක්වීමට ගන්නා ලද වෑයමයි.
   (1) සිංහල ගීතයේ සැබෑ ලක්ෂණය නම් මිනිස් හැඟීම් සියුම්ව නිර්මාණය කිරීමයි.
   (2) ගීතය මගින් කෙරෙන්නේ මිනිසුන් අතර වන සියුම් සබඳතා විශේෂයෙන් නිර්මාණය කිරීමයි.
   (3) මිනිස් සබඳතා නිර්මාණය කිරීම සිංහල ගීතයේ යථාර්ථවාදී ප්‍රවණතාව වී ඇත.
   (4) යථාර්ථවාදී ප්‍රවණතාවෙන් යුත් සිංහල ගීතය මිනිස් සබඳතා සියුම්ව නිර්මාණය කිරීමට උත්සාහ දරා ඇත.

37. "ඔක්කොම ළමයි ටික ආපහු ගියා. දැන් ඉතින් ඔය ළමයත් යන්ඩ, කියලා ගුරුතුමී කිව්වා"
   යන වාක්‍යය ලිඛිත වහරට හැරවූ විට **වඩාත් නිවැරදි වරණය** තෝරන්න.
   (1) ඔක්කොම ළමයි ආපසු ගිය නිසා ඔයත් යන්න යැයි ගුරුතුමී කීවාය.
   (2) ළමයින් සියලු දෙනා ආපසු ගිය හෙයින් ඔබත් යන්නැයි ගුරුතුමී පැවසුවාය.
   (3) ළමයි ඔක්කොම ටික ආපසු ගිය හින්දා ඔය ළමයාත් යන්නැයි ගුරුතුමී කීවාය.
   (4) ළමයින් සියලු දෙනා පෙරළා ගියා යැයි දැන් වූ ගුරුතුමිය ඔය ළමයාත් ආපසු යන්නැයි පැවසීය.

38. නිවැරදි ප්‍රකාශය සහිත වරණය තෝරන්න.
   (1) ගිරි ලිපි ලෙස හැඳින්වෙන්නේ ගල්ගුහා ඇතුළත ලියන ලද සෙල්ලිපි වේ.
   (2) වෙවැල් කැටිය, තෝනිගල ආදී ස්ථානවල ලෙන් ලිපි දක්නට ලැබේ.
   (3) ගල් ලැලිවල කොටා ඇති සෙල්ලිපි "පදර ලිපි" ලෙස හැඳින්වේ.
   (4) පැරණි ගල්ඔරු පියගැටපෙළ ආදියෙහි කොටා ඇති සෙල්ලිපි හැඳින්වෙන්නේ "ටැම්ලිපි" නමිනි.

39. පැරණි බෞද්ධ සාහිත්‍ය පොත්පත් සියල්ලම පාහේ ශ්‍රැතිගෝචර රටාවෙන් ලියවී තිබීම විශේෂත්වයකි.
   මේ වාක්‍යයේ ශ්‍රැතිගෝචර යනු
   (1) ගායනයට යෝග්‍ය ආකාරයෙන්
   (2) අසා රසවිඳීමේ අරමුණින් ලියන ලද
   (3) අනුප්‍රාස රසයෙන් යුක්ත
   (4) ශබ්ද හා අර්ථ රසයෙන් අනූන වූ

40. "විළිකුන් සුරත් පල වැනිවේ රිවි මඬල" යන පද්‍ය පාඨයේ අර්ථය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.
   (1) හිරු තද රත් පැහැ ගත් වියළි ගෙඩියක් මෙනි.
   (2) හිරු මඬලත් රතුපාට ගෙඩියත් එක්වූ බව පෙනේ.
   (3) ඉදී රතුපාට වූ ගෙඩිය හිරු මඬල මෙන් දිස්වේ.
   (4) හිරු තද රතුපාට ඉදුණු ගෙඩියක් මෙන් පෙනේ.

6 වන පිටුව බලන්න

# සිංහල භාෂාව හා සාහිත්‍යය II

* ප්‍රශ්න **සියල්ලට ම** උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

- අංක **i** සිට **x** තෙක් ඇති **සියලුම** අනුකොටස්වලට උත්තර ලියන්න කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ** නම් එහි **අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

1. i සිංහල අක්ෂර මාලාවේ ඇතුළත් කණ්ඨජ අක්ෂර දෙකක් ද අන්තඃස්ථාක්ෂර දෙකක් ද ලියා දක්වන්න.

ii පහත සඳහන් පද දෙකෙහි **විරුද්ධාර්ථ රූප** ලියන්න.
අනිවාර්ය
විදග්ධ

iii පහත සඳහන් වාක්‍යවල තද කළු අකුරින් දැක්වෙන පද අයත්වන **ක්‍රියාවර්ග** නම් කරන්න.
(අ) ගුරුතුමිය ශිෂ්‍යයාව ලවා මල් අසුන පිරිසිදු **කරවයි.**
(ආ) වැසි **වැටුණොත්** ඒ සොඳුරු මොහොත අඳුරු වේ සැණින්.

iv පහත සඳහන් පද දෙක **විසන්ධි කොට** ලියන්න.
(අ) සුරිඳු
(ආ) ළිංපඩිය

v පහත සඳහන් (අ) සහ (ආ) කොටස්වල එන වාක්‍ය දෙකෙහි පවතින **සදොස් වචන දෙක නිදොස් කොට** ලියන්න.
(අ) සාගර ගවේෂණය මෙන්ම අභ්‍යවකාෂ තරණය ද සඳහා මිනිසා මහත් උනන්දුවක් දක්වයි.
(ආ) ව්‍යංගාර්ථවත් කාව්‍යය "ධ්වනි කාව්‍යය" නමින් ද හැඳින්වේ.

vi පහත සඳහන් වාක්‍ය **දෙක නිදොස්** කොට ලියන්න.
(අ) රෝහල තුළ කිසිවෙක් සිටියේ නැත.
(ආ) ගුරුවරියක් මෙන් සැරසුණු දැරිය පාසලේ විවිධ වේශ නිරූපණ සංදර්ශනයකට සහභාගි වූවාය.

vii පහත සඳහන් වාක්‍ය දෙකෙහි කළු අකුරින් දැක්වෙන පද කවර ව්‍යාකරණ අංගයකට අයත් දැයි දක්වන්න.
(අ) ඇමතිතුමා **නොහොත්** නියෝජ්‍ය ඇමතිතුමා ප්‍රදර්ශනය විවෘත කරයි.
(ආ) අම්මා සිය දිගු වරල **සමන් මලින්** සරසා ගත්තාය.

viii මෙහි (අ) හා (ආ) කොටස්වල එන කර්තෘ කාරක වාක්‍ය **දෙක කර්ම කාරකයට හරවා** ලියන්න.
(අ) බැතිමත්හු විවිධ පුද පූජා පවත්වමින් දෙවියන් පුදති.
(ආ) ග්‍රාම නිලධාරිතුමා තම ප්‍රදේශයේ නියං ආධාර බෙදා දීමට පැමිණි ව්‍යාපාරිකයන් සාදරයෙන් පිළිගත්තේය.

ix පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් **තද්ධිත පද දෙක** තෝරා ලියන්න.
රසායනික පොහොර යෙදීම නිසා බුලත් කිනිති දලුලා වැඩෙයි.

x වාපි සංස්කෘතිය ආශ්‍රිතව ජන වහරේ පවත්නා පහත සඳහන් වචනවල අදහස ලියන්න.
(අ) දිගිලිය
(ආ) අමුණ

**(එක් නිවැරදි පිළිතුරකට ලකුණු 02 බැගින් ලකුණු 20 යි.)**

7 වන පිටුව බලන්න

**2.** පහත දැක්වෙන **අ, ආ, ඉ, ඊ** යන විස්තර අතුරෙන් **එකක්** තෝරාගෙන, **වචන 250කට නොඅඩු** වන සේ රචනයක් ලියන්න. ඒ සඳහා සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(අ) වර්තමාන ශ්‍රී ලංකාවේ මාර්ග පද්ධතියේ කඩිනම් සංවර්ධනයක් දක්නට ලැබේ. අධිවේගී මාර්ග හා නව මාර්ග තැනීම මෙන්ම අබලන් මාර්ග ප්‍රතිසංස්කරණය ද මෙහි දී වැදගත් වේ. රියැදුරන්ගේ හා පදිකයන්ගේ නීතිගරුක බව, මාර්ග සංඥා පද්ධතියේ ක්‍රියාකාරීත්වය ආදි කරුණු කෙරෙහි ද අවධානය යොමු කළ යුතු වේ. මේ අනුව අනාගතයේ දී මාර්ග සංවර්ධනයේ වඩාත් යහපත් ඵල නෙළාගත හැකි ය.

(ආ) වර්තමානයේ මෙරට ළමා ජීවිතවල වටිනාකම බෙහෙවින් අඩු වී ඇති බවක් දක්නට ලැබේ. දිනෙන් දින සිදු වන ළමා අපචාර හා ළමා මරණවලින් ඒ බව පැහැදිලි වේ. මෙහිදී දෙමව්පියන් හා වැඩිහිටියන් තම දරුවන් පිළිබඳ ව වඩාත් සැලකිලිමත් විය යුතු ය. ළමා අපචාර හා ළමා මරණ වැඩිවීම කෙරෙහි බොහෝ කරුණු හේතු වී ඇති අතර, ළමා පරපුර රැකගැනීම අප කාගේත් වගකීමක් හා යුතුකමක් වේ.

(ඉ) සන්නිවේදන තාක්ෂණය නූතන ලෝකයේ ඉතා ඉහළ මට්ටමක පවතී. ඒ මගින් සමස්ත ලෝකය ම එකට බැඳී ඇත. එහෙත් එහි අහිසි ඵල ද සමාජයේ පරිහාණියට ප්‍රබලව බලපා ඇත. සන්නිවේදනය උදෙසා වූ තාක්ෂණය අපභාවිතයෙන් තොරව යහපත් අරමුණු උදෙසා පමණක් යොදා ගැනීම ඉතා වැදගත් කරුණක් වන්නේය.

(ඊ) ශරීර සුවතා වැඩසටහන යටතේ පාසල් දරුවන් ක්‍රීඩාවට නැඹුරු කරවීම සඳහා වර්තමානයේ විවිධ ක්‍රියාමාර්ග ආරම්භ කොට ඇත. සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බිහි කිරීම සඳහා ක්‍රීඩාව අත්‍යවශ්‍ය වේ. ක්‍රීඩාව මගින් ජය පරාජය හමුවේ නොසැලී සිටීමේ හැකියාව මෙන් ම විනෝදාස්වාදය ද ලැබේ. මේ අනුව අප රටේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් විවිධ ක්‍රීඩා ඉසව් ඔස්සේ ක්‍රීඩා කෙරෙහි යොමු කරවීම ඉතා වැදගත් වේ. මෙහි දී විවිධාංග එකතු කරමින් ක්‍රීඩා ක්ෂේත්‍රය ද පුළුල් කළ යුතු වේ.

**(ලකුණු 25 යි)**

**3.** පහත දැක්වෙන පාඨය වචන 50 - 60 අතර ගණනකින් යුක්ත වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව ද සාරාංශය අග යොදන්න.

මිනිසුන් හා බොහෝ දුරට සමාන වානර වර්ග දෙකොටසක් වෙති. මානව-වානර වශයෙන් එක් කොටසක් හැඳින්විය හැකි ය. ඔවුන්ගේ අස්ථි පඤ්ජරය සම්පූර්ණයෙන් ම මිනිසුන්ගේ අස්ථි පඤ්ජරය හා සමාන ය. වෙන් වෙන් වශයෙන් බලතත් ඇටයක් පාසා ම ඒකාකාර ය. ගතිපැවතුම් වශයෙන් ද ඔවුන් අතර බොහෝ සමානකම් තිබේ. මිනිසුන්ට වැළඳෙන රෝග ඔවුන්ට ද වැළඳේ. මිනිසුන්ගේ ලේ වර්ගය ද ඔවුන්ට ඇති නමුත් ඔවුන්ගේ මොළයේ ප්‍රමාණය ඉතා කුඩා ය. ඔවුන්ට හිස කෙළින් ඔසවා ගෙන ඇවිදීම කළ නොහැකි ය. කථා කිරීමට නුපුළුවන. ගිනි නිපදවීම ගැන ඔවුන්ට දැනුමක් නම් කොහෙත් ම නැති බව කවුරුත් දනිති. ඔවුන් අතර මූලික සුළු සාමාජික සිරිත් ඇතත් ඒවා මිනිස් ගතිවලට වැඩි සමානකමක් ඇතැයි නොසිතිය යුතුයි. මේ වර්ගයට ඇතුළත් වන්නෝ අප්‍රිකාවේ වසන ගොරිල්ලා හා මලයා දේශයේ වසන චිම්පන්සි, ඔරං උටං යන සත්ත්වයෝ ය.

අනෙක් වානර වර්ගයා සාමාන්‍ය වානර කොට්ඨාසවලට ගැනෙන වඳුරු ජාති ය. මොවුහු ද වලිගා සහිත කොටසක් ද වලිගා රහිත කොටසක් ද කියා ප්‍රධාන දෙකොටසක් වෙති. මේ දෙකොටස පැරණි ලෝකයට අයත් වර්ගය හා අලුත් ලෝකයට එනම්, ඇමරිකාවට අයත් වර්ගය වශයෙන් බෙදා ඇත. දැනට ප්‍රකාශිත වී තිබෙන කරුණු අනුව මානව - වානර වර්ගයා මනුෂ්‍යයාගේ කිට්ටු නෑදැයින් හැටියට පිළිගන්නට වී තිබේ. ඔවුන්ට ඇතැම් විට දෑත බිම නොගා කකුල් දෙකෙන් ගාට ගාටා වාගේ යා හැකි ය. මොළය විශාල වී දියුණු නොවූවත් එය තරමක් තිබෙන බව පිළිගත යුතු ය.

**(ලකුණු 10 යි)**

**4.** පහත දැක්වෙන ඡේදය කියවා ඒ සමග ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.

පැරණි සිංහල ගම සංවිධානය වූයේ කෘෂිකර්මාන්තය ප්‍රධානතම ජීවනෝපාය කරගනිමිනි. එහිදී ස්වාමිපුරුෂයා මෙන් ම භාර්යාව ද මෙම ආර්ථික චර්යාවට විශාල දායකත්වයක් ලබා දුන් බව පෙනේ. විශේෂයෙන් කාන්තාවගේ පැත්තෙන් බලන විට ගෘහීය කටයුතු පාලනය කර ගැනීම, පැළ සිටුවීම, වල් නෙළීම, අස්වනු නෙළීම, අස්වැන්න වේලා ගබඩා කර ගැනීම ආදි කාර්යභාරයන් රැසක ඇය නියුක්ත වූ බව පෙනේ. මෙහි දී වඩාත් වැදගත් කාරණයක් වන්නේ දේපළ උරුම වූ ආකාරය විමසා බැලීමයි. එය තීරණය වූයේ විවාහ ක්‍රමය මතයි. දීග විවාහයක දී පිරිමින් දැවැද්දක් සමග ස්ත්‍රියක සරණ පාවා ගත් අතර, නිශ්චල දේපළවලට උරුමකම් කියන ලද බව පෙනේ. බින්න විවාහයක දී ස්ත්‍රිය මෙම දේපළවලට උරුමකම් කියූ අතර එහි දී පිරිමියාට දීග විවාහයක දී මෙන් දේපළවලට අයිතිවාසිකමක් හිමි නොවී ය. පොදුවේ බින්න විවාහය ජනප්‍රිය නොවුණ ද ඒ කෙරෙහි ඇතැම් සමාජ ආකල්ප ගොඩ නැගුණ ද සාම්ප්‍රදායික ලාංකික සමාජයේ බින්න විවාහය යම් ප්‍රමාණයකට හෝ ක්‍රියාවට නැගුණ බව පෙනේ. මෙයින් පැහැදිලි වන්නේ කාන්තාවගේ සමාජ තත්ත්වය හා කාර්ය භාරය පවතින සමාජ සංස්කෘතික හර පද්ධතීන්ට අනුව තීරණය වන බවයි. දැවැද්ද ස්ත්‍රියගේ පාර්ශ්වයෙන් ලබා දිය යුත්තක් වුවත් එමගින් නව පවුල් ඒකකයේ ආර්ථික සමබරතාව ආරක්ෂා කරනු ලැබීය.

1. කාන්තාව නියුක්තව සිටි කාර්ය භාරයන් මොනවා ද?
2. මේ පාඨයේ ඇතුළත් විවාහ ක්‍රම දෙක කවරේ ද?
3. පැරණි සිංහල ගම් සංවිධානයේදී ඉස්මතු වී පෙනෙන විශේෂතාව කුමක් ද?
4. විවාහයෙන් පසු දේපල අයිතිවාසිකම් අතින් කාන්තාවට හා පුරුෂයාට හිමි වූ විශේෂ වරප්‍රසාද කවරේ ද?
5. දැවැද්ද මගින් පවුල් ඒකකයට සැලසුණු යහපත කුමක් ද?

**(ලකුණු 10 යි)**

**5.** පහත දැක්වෙනුයේ පුවත්පතක පළ වූ දැන්වීමකි. එම දැන්වීම කියවා අදාළ ආයතනයට යැවීම සඳහා ඔබේ ජීව දත්ත හා අධ්‍යාපන සුදුසුකම් ඇතුළත් කොට අයදුම්පතක් පිළියෙල කරන්න.

**රැකියා ඇබෑර්තු**
**සමීක්ෂණ නිලධාරීන් අවශ්‍යයි**

අප ආයතනයේ සේවය උදෙසා නව සමීක්ෂණ නිලධාරීන් බඳවා ගැනීම ආරම්භ කර ඇත. අ.පො.ස. (සා.පෙළ) සමත් වයස අවු 18-25 අතර ස්ත්‍රී, පුරුෂ දෙපක්ෂයට ම මේ සඳහා අයැදුම් කළ හැකි ය. ආකර්ෂණීය වැටුපක් ද උපයාගත හැකි වේ.

පරිගණක තාක්ෂණය පිළිබඳ දැනුම විශේෂයෙන් අපේක්ෂා කෙරේ. අයදුම්පත් දෙසැම්බර් 31ට පෙර පහත ලිපිනයට යොමු කරන්න.

සමාජ පර්යේෂණ ආයතනය
අංක 317
ඕල්කොට් මාවත
කොළඹ 11

1994 ජනවාරි 10 වෙනි දින උපන්, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආරුගම අංක : 148 නිවසේ පදිංචි ශ්වේතා කල්‍යාණී ඔබ යයි සිතන්න.

නැතහොත්

අනුරාධපුර රන්ටැඹ මහ විදුහල ආරම්භ වී පනස් වසරක් පිරීම නිමිති කොට ළමා කුසලතා ඇගයීමේ වැඩ සටහනක් පාසල් ආදි ශිෂ්‍ය සංගමය මගින් සංවිධානය කොට ඇත. ගද්‍ය, පද්‍ය හා නාට්‍ය රචනා, චිත්‍ර හා කථික තරග කනිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ අංශ යටතේ පැවැත්වේ. 2014.12.05 දින පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේ දී සියලු තරග පැවැත්වීමට විධිවිධාන යොදා ඇත.

ආදි ශිෂ්‍ය සංගමයේ ලේකම් සමන් පාලිත ඔබ යයි සිතා කලාපයේ අනිකුත් පාසල්වල සිසු-සිසුවියන් දැනුවත් කිරීම උදෙසා යෝග්‍ය දැන්වීම් පත්‍රිකාවක් පිළියෙල කරන්න. (මේ සඳහා වචන 100ක් ප්‍රමාණවත් ය.)

**(ලකුණු 15 යි)**

* * *

# අ.පො.ස. (සා.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2014

**සිංහල භාෂාව හා සාහිත්‍යය III** | පැය දෙකයි

**වැදගත් :** උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් උත්තර සපයන්න.
* **1, 2, 3, 4** ප්‍රශ්නවලටත් **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකටත්** උත්තර සපයන්න.
මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80** කි.

**1.** (i) සිට (×) තෙක් ඇති **සියලු** ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉරක් අඳින්න.

1. i "කාගෙ කාගෙත් ඇස් ඒ මේ අත කරකැවුණා. ඉහළ යන අතක් පෙනෙන්නට තිබුණේ නෑ."
(අ) මෙම පාඨයට අදාළ අවස්ථාව කුමක් ද?
(ආ) අතක් එසවූයේ කවුරුද?

ii "දෝසක් නැති වැ අතරෙකැ වියැ මියැයන්ට
**මේ සක් නුදුටු කලැ** කියනෙමි කවුරුැන්ට
(අ) මෙම කවියේ මුල් පද දෙක සම්පූර්ණ කරන්න.
(ආ) තද කළු අකුරින් මුද්‍රිත කොටසෙහි අර්ථය ලියන්න.

iii "බලයක් ඇද්ද නැද්ද කියලා මම දන්න බව උඹ දැන් වත් දැනගනින්"
(අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කාහට ද?
(ආ) මෙවැනි ප්‍රකාශයක් කිරීමට හේතු වූ කාරණය කුමක් ද?

iv විගසින් ඇහිඳ ගත්තෙමි අමයුරු ලෙසට
සීනෙන් තරුව ගිලුණා මගෙ ගැබ තුළට
(අ) අමයුරු යන්නෙහි අදහස පැහැදිලි කරන්න.
(ආ) මෙම පද්‍ය ඇතුළත් ග්‍රන්ථය ලියන ලද්දේ කවර යුගයකදී ද?

v "තොපට සුදුසු තැනක් දැන ගොසින් සිටගනුවයි"
(අ) මෙහි තොපට යනුවෙන් ආමන්ත්‍රණය කරන්නේ කුමන දෙයකට ද?
(ආ) මෙම පාඨය ඇතුළත් ග්‍රන්ථය රචනා කළ රචකයාගේ නම කුමක් ද?

vi එහෙම වුණත් මා නොදන්න දෙයක් තියෙනවා අහන්න
දන්න කෙනෙක් හොයා බලා මට මේ ගැන කියා දෙන්න
(අ) මෙහි දැක්වෙන අය නොදන්නා දෙය කුමක් ද?
(ආ) මෙම පද්‍ය පන්තිය උපුටා ගන්නා ලද ග්‍රන්ථය කුමක් ද?

vii "උඹලාගෙ ජාතියෙ කුලීකාරයෝ සේරම එක වාගෙ"
(අ) ඉහත ප්‍රකාශය කා විසින් කරන ලද්දක් ද?
(ආ) මෙම පාඨය ඇතුළත් කතාවේ රචකයා කවුරුද?

viii ගිතෙලැ **හූනන්** කැ ර
ගිනිදෙවි පුදා දද ව ර
(අ) තද කළු අකුරින් දැක්වෙන පදයේ අර්ථය ලියන්න.
(ආ) මෙම පද්‍ය පාඨ ඇතුළත් ග්‍රන්ථය රචනා කරන ලද්දේ කාගේ ආරාධනයෙන් ද?

ix "මගෙනුදු සැපත් ගෙන මාගේ රජගෙය සමීපයෙහි ගෙයක් නංවාගෙන මා ළඟ සුවසේ වසව."
(අ) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩම අයත් ග්‍රන්ථය කුමක් ද?
(ආ) මෙවැනි ප්‍රකාශයක් කිරීමට හේතු වූයේ කුමක් ද?

x "සැදැ ඇතත් සමහර කෙනෙක් සංග්‍රහසීලී නොවන හෙයින් සංග්‍රහ කට නොහෙති. මේ තෙමේ සංග්‍රහ කට හේ දෝහෝ"
(අ) මෙසේ සිතන්නේ කා විසින් ද?
(ආ) "මේ තෙමේ" යනුවෙන් සිතන්නේ කවරෙකු පිළිබඳව ද?

**(ලකුණු 20 යි)**

2 වන පිටුව බලන්න

**2.** පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය **පාඨවල තද කළු අකුරින්** මුද්‍රිත කොටස්වල අර්ථය වෙන් වෙන් ව ලියන්න. ඉන් පසු මුළු කොටසේ ම අර්ථය ලිහිල් බසින් ලියන්න.

(අ) **ගී දේවියට** කැප කළ දෙවොලකට    සම
කුටියක සුවඳ දෙයි **කළුවැල්** කපුරු    දුම
අද නම් නුවරඑළියකි මා වෙසෙන    ගම
මෙ පමණ අලස දවසක් නුදුටුයෙමි    මම

(ආ) උන් ඉදිරියේ **මෝරවය** තබාලා ඒ මත්තේ රන් තළිය තබාලා අගය කළ කලට ලක්ෂයක් වටිනා බත බා ලති. **උයි** නළුවන් පිරිවරා ශ්‍රී සමෘද්ධීන් යුක්තව බත් කති.

(ඉ) එපරිද්දෙන්ම යම් අනිකුත් සත්වයෙක් උපායක් නැතිව තමාට වස්තු කැමතිව වීර්ය කෙරෙත් නම් සර්වප්‍රකාරයෙන් තෙමේත් නස්නේය. අනුන්ටත් විනාශයට **ප්‍රත්‍යය** වන්නේ යයි වනය **ඒකනින්නාද** කොට දෙවියන් සාධුකාර දෙමින් සිටියදී.

(ඊ) ගමේ මැ පුහුලම්    ඉදවන්නී
සොරුන් බවට වවුලන්    ලන්නී
**නොතැනැ වවුලු පළවල්**    දෙන්නී
ගම් දරුවන් හට වැඩ    දෙන්නී

**(ලකුණු 20 යි)**

- **3, 4** යන ප්‍රශ්න සඳහා වන උත්තරයක වචන 125ක් පමණ තිබීම සෑහේ.

**3.** වේදබ්භ ජාතක කතාව ඇසුරින්
(අ) දුර්වච බවෙහි විපාක දැක්වීම
(ආ) දූරදර්ශීව, ඉවසිලිවන්තව බුද්ධිමත්ව තීරණ ගැනීම
යන කරුණු නිදසුන් **දෙක** බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

**නැත හොත්**

ජීවක කථාවස්තුවෙන් කතුවරයා
(අ) තත්කාලීන සමාජ තොරතුරු දැක්වීම
(ආ) උක්ත සමාජයේ වෛද්‍යවරයෙකු සතු වූ දැනුම් සම්භාරය එළි දැක්වීම,
සාර්ථක ලෙස සිදු කර ඇත. එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විස්තර කරන්න.

**4.** (අ) අතිශය දුක්ඛදායක අත්දැකීමක් මනහර ලෙස ඉදිරිපත් කිරීම
(ආ) උචිත කාව්‍යෝපක්‍රම භාවිතය
යන කරුණු "කිසාගෝතමියක නොවේ" පද්‍ය පන්තියේ සාර්ථකත්වයට හේතු වී ඇති අයුරු එක් කොටසකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

**නැත හොත්**

"පොළෝ කුහරයෙන් පැමිණි මිනිසා" කෙටිකතාවෙන්
(අ) සමාජ විෂමතාව එළි දැක්වීම,
(ආ) ශ්‍රේෂ්ඨ මිනිසෙකුගේ අධ්‍යාත්මය රාසල් ජු චරිතය ඇසුරින් පෙන්නුම් කිරීම
යන කරුණු, නියමිත පාඩමින් එක කොටසකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විස්තර කරන්න.

**(ලකුණු 15 යි)**

- **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර ලියන්න. (උත්තරයක වචන **100ක්** පමණ තිබීම සෑහේ.)

**5.** ගැමි විශ්වාස පදනම් කරගත් දරු සිහින මාලාවක් විචිත්‍ර ලෙස සිත්තම් කරන්නට කවියා සමත් වී ඇත. "මහමායා දේවිය දුටු සිහිනය" පද්‍ය පන්තියෙන් උදාහරණ **තුනක්** දක්වමින් පැහැදිලි කරන්න.

**6.** ගැමි සමාජය ඇසුරින් තෝරාගත් වචන හා උපමා සහිත භාෂාව භාවිතය නිසා හක්තහක්තික සිටාණෝ කථාවස්තුව පැසසුමට ලක් වී ඇත. උදාහරණ **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න.

**7.** කාව්‍යමය චින්තා පහළ කරමින් වැස්ස පිළිබඳව අපූර්ව චිත්‍රයක් මවන්නට කවියා සමත් වී ඇත. "වැස්ස" පද්‍ය පන්තියෙන් උදාහරණ දක්වමින් විස්තර කරන්න. **(ලකුණු 10 යි)**

* * *